## හොඳ මිනිස්සු



අපේ ප්‍රවීණ ලේඛකයකු වන දයා දිසානායක මහත්තයා වත් පොතේ මෙහෙම සටහනක් දාලා තිබුණා.

*පෙබරවාරි 16 වෙනිද සවස දිල්ලි ගුවන්තොටුපලේ බස් එකක මගේ නෙක්සස් ටැබ්ලට් එක නැති උනා. පිටත්වීමෙ පර්යන්තයෙ තොරතුරු අංශයෙ සිටි නිලධාරිනිය උත්සාහ කළා සොයන්න. මං ඒක හිතෙන් අයින් කර ගත්ත. ඒ උනාට දවස් දෙකකට විතර පස්සෙ ඊමෙල් පනිවිඩයක් ආව ටැබ්ලට් එක තියෙනව කියල. දිල්ලි නුවර දැරියකගෙන්. එයා ඒක දිල්ලි නුවර මගේ හිතවතෙකුට ලබා දුන්න. මේ දැරියගෙ නම නේහා සිංග්. Neha Singh ඉන්දියාවෙ තරුණ පරපුර අතරෙ තාමත් මනුස-"සකම තියෙනව. නැත්නම් ඒ දැරිවිට ඒ ටැබ්ලට් එක තියාගන්න තිබුන කිසිම ප්‍රශ්නයක් නැතුව. ඒත් එයා එහෙම කළේ නැහැ. ඒක ආපහු දෙන්න මගෙන් කිසිම තෑග්ගක් වත් බලාපොරොත්තු උනෙත් නැහැ.*

මේ වගේම සිදුවීමක් පහුගියදාක මෙල්බන් නුවරදිත් සිදුවුණා. කීර්ති පොතුවිල අපේ හිතවතා මුදල් ඩොලර් හත් අටසීයක් සහිත මුදල් පසුම්බිය බස්රියේ අමතක කර දමා ඇවිත් තිබුණා. "ඕක හොයන්න මහන්සි වෙන්න එපා.. කවුද මේ රටේ ඔහොම එකක් ආපහු දෙන්නෙ?" වැඩි-දෙනෙක් කිව්වෙ එහෙමයි. එත් යාලුවන් කියන කිසිම දෙයක් කනකට ගන්නෙ නැති කීර්ත් බස් ඩිපෝවට ගිහින් තමන්ගෙ මුදල් පසුම්බිය නැතිවීම ගැන කියලා තිබුණා. වැඩි වෙලාවක් ගියේ නැහැ අර බස් රිය පදවපු රියදුරා අතින් ඔහුට මුදල් පසුම්බිය නැවත ලැබුණා. සතයක් වත් අඩු නැතිව.

මේ ලෝකෙ හොඳ මිනිස්සු නැතිම වෙලා ගිහින් නැහැ. තාමත් ඉන්නවා.

## සිංහල




සන්නස පත්තරේ පළවුණ ඉංගිරිසි දැන්වීමක වචනයක් වැරදිලා තිබුණයි කියලා ඒක උපහාසයට ලක්කරමින් යම්කිසි අයකු ලිපියක් එවා තිබුණා කියලා මට කිව්වෙ සන්නස සංස්කාරකවරයා. අදාල වෙළඳ ආයතනයට යැවිය යුතුව තිබුණ ලිපියක් සන්නසට එවා තිබුණාය කියන කාරණය පැත්තක තියමුකො. ඉංගිරිසි භාෂාවේ වචන ගැන මේ දක්වන කැක්කුම සිංහල භාෂාවේ වචන ගැන නොදක්වන්නෙ ඇයි කියන එක තමයි ඒ කතාව ඇහුව ගමන් මගේ හිතට ආවෙ.

අපේ පත්තර වල කොයි තරම් වැරදි සිංහල වචන දකින්න ලැබෙනවද? අනේ කවමදාකවත් කිසිම කෙනෙක් ඒවා පෙන්නලා ලිපියක් එවලා නැහැ. සිංහල ඉංගිරිසිය තරම් උතුම් නැතුවාවත්ද?

වෙන එකක් තියා අපේ සිංහල පාසල් වලින් නිකුත් වන ප්‍රකාශන වල කොයි තරම් වැරදි සිංහල තියෙනවද? මේ වැරදි දුටු විට කොපමණ පිරිසකට අපි ඒ වැරදි ගැන කියා දී තියෙනවද? ඒවා නිවැරදි කරගත්තෙ කීයෙන් කී දෙනෙක්ද?

උක්ත අඛ්‍යාත වැරදියට ලියන ලිපි ලේඛණ කොයි තරම් අපට කියවන්න ලැබෙනවද? "මා ... ගියෙමි" "අප .. ගියෙමු" කියා ලියන්න බැහැ කියන එකවත් නොදන්න අය කොයි තරම්ද? මේ දේ ගැන සමාජයේ උනන්දුවක් නැත්තෙ ඇයි?

අප සිනාසිය යුත්තේ ඉංගිරිසි වරද්දනවාට නොවෙයි. සිංහල වරද්දනවාටයි. මොකද ඉංගිරිසිය අපේ මව් භාෂාව නෙවෙයි. නමුත් සිංහලය..?




## හරුන් ලන්ත්‍රා සහ හේමන්ත ඩයස්



හේමන්තයේදී ප්‍රසංගය කතා බහ තුළින් කතා බහට ලක් කරන්න කරුණු කාරණා රැසක් අපට ඉතිරි කළා.

හේමන්තයේදී 2 ප්‍රසංගයේ ලබන ආදායමෙන් රුපියල් 50000 ක් ප්‍රසංගය පවත්වන්නත් කලින් අපේ ප්‍රවීණ ගායක හරූන් ලන්ත්‍රා මහතාට බාර දෙන්න හේමන්ත ඩයස් කටයුතු යොදා තිබුණා. මේ උතුම් කාර්යය කරන්න හේමන්තට අත දුන්න ගමිණි කරව්දෙණිය ඇතුළු අපේ හිතවතුන්ට අපේ ආචාරය හිමිවෙනවා. ජීවිත කාලය පුරා අප රස වින්දනයේ ගිල්ලපු කලාකරුවන් වයෝවෘද්ධ වෙලා අසරණ වුණාම අපට හැකි ආකාරයෙන් ඔවුන්ට අත දෙන්න උත්සාහ කරන සද්ගුණය දැකීමත් සතුටක්.

මේ සිදුවීමත් එකක් පසුගිය සිදුවීමක් මට මතක් වුණා. අපි මෙයට වසරකට පමණ පෙර හරූන් ලන්ත්‍ර මහතා සමග කළ සාකච්ඡාවක් සන්නසේ පළ කළා. ශ්‍රී ලංකාවෙ සිට අපට ලියන ප්‍රවීණ ලේඛක ශ්‍රීලාල් සෙනෙවිරත්න ඒ සාකච්ඡාව අවසානයේ හරූන් ලන්ත්‍රා මහතාගේ ලිපිනය සහ දුරකතන අංකය ලියලා ඉල්ලීමක් කර තිබුණා හැකි හැම කෙනෙක්ම මේ අති දක්ෂ ගායකයාට ආධාරයක් කරන්න කියලා. දන්න තරමින් නම් කතා කරල තිබුණ ප්‍රමාණය අතේ ඇඟිලි ගණනටත් වඩා අඩුයි.

මේ වගේ දේකට රුපියල් ලක්ෂ ගණන් වලින් ආධාර කරන්න අවශ්‍ය නැහැ. මම හැමදාම කියනවා වගේ චිකන් බර්ගර් දෙකක් කන්න වැය කරන මුදලටත් වඩා අඩු මුදලක් වන ඩොලර් දහයක ආධාරයක් කරන්න වත් අපේ අය උනන්දු නැහැ. උනන්දු වෙලා ලිස්ට් එකක් හදන කෙනෙකුට වුණත් "හරි මචං මගේ නමත් දාගනින්." කියලා ඒකට නම ලියනවා විතරයි. සල්ලි දෙන තැනට ආවම කවුරුවත් කතා කරන්නේ නැහැ. අන්තිමේ ලිස්ට් එක හදපු කෙනා අර යාලුවන්ගෙන් සල්ලි ඉල්ල ඉල්ල පස-"සෙන් යන්න බැරි නිසා තමන්ගෙ අතින් කීයක් හරි දාල වැඩේ අවසාන කරනවා.

දැනට අවුරුද්දකට පමණ පෙරදි හරූන් ලන්ත්‍රා මහතාට උපහාර උත්සවයක් ලංකාවේ ඉන්න හිතවතුන් පිරිසක් ලෑස්ති කළා. ඒ උත්සවෙයෙදි ලන්ත්‍රා මහත්තයට පිරිනමන්න ඔස්ට්‍රේලියාවෙ ඉන්න රසිකයන්ගෙන් තිළිණයක් ලෙස රූපවාහිණී යන්ත්‍රයක් ලබා දෙන්න පුලුවන්ද කියලා අපෙන් විමසා තිබුණා. ලැයිස්තු දමා සල්ලි එකතු කිරීමේ අත්දැකීම් දන්න නිසා අපි කළේ අපි දන්නා යාලුවන් හතර පස් දෙනෙක් එකතු වෙලා මුදල් යොදවලා ලන්ත්‍රා මහතාට ෆ්ලැට් ස්ක්‍රීන් රූපවාහිණී යන්ත්‍රයක් ලබා දීම. ඒ සත් කාර්යයට දායක වෙච්ච මහීල් මුණිදාස ශ්‍රීනාත් මද්දුමගේ දයාන් රණසිංහ දිනේෂ් පෙරේරා කීර්ති පොතුවිල කියන අපේ හිතවතුන්ටත් ස්තුති කරන්න මේ අවස්ථාව යොදා ගන්න කැමතියි.

කිවිඳෙකු ළයේ ලේ තැවරුණු හඳපානේ
සිතුවිලි ලඳුන් ඇවිදින්නට යනවානේ
රන්වන් තුඩින් කවි ලියැවෙන මගෙ පෑනේ
අවසන් කවිය අවසන් නැත අවසානේ

## හේමන්ත



හේමන්ත ඩයස් හැබෑම දක්ෂ ගායකයෙක්. ඔහු නැවත වතාවක් අපට ඒක පෙන්නුවා ඔහුගෙ හේමන්තයේදී 2 ප්‍රසංගයෙදි. ඔහු අප දන්නා ඕනෑම ප්‍රවීණ ගායකයකු හා කරට කර ඉන්න පුලුවන් තරමේ ගායන කුසලතාවක් පෙන්නුවෙ අප සැම සතුටට පත් කරමින්.

මේ ප්‍රසංගය නරඹද්දි මා ළඟින් වාඩි වෙලා හිටිය රෝහණ කරුණාරත්නත් එකඟ වුණ අදහසක් තමයි ඇයි මේ තරම් දක්ෂ ගායකයන්ට මේ නගරයේ අපේ සමාජයේ මිනිස්සු නියම තැන ලබා නොදෙන්නෙ කියන කාරණය. හැම තිස්සෙම තමන් අතර ඉන්නා දක්ෂයා දිහා නොබලන - නොදැක්කා වගේ ඉන්න - මොකක්දෝ කුහක කමක් අපේ සමාජයේ බොහෝ අය පෙන්වනවා. මේක හරිම අවාසනාවන්ත දෙයක්.

ගීත ගායනා ක්ෂෙත්‍රයේ "මෙල්බන් ගායකයා" කියලා අනු කුලකයක් (වෙනම ශානරයක්?) අපේ ගුවන් විදුලි නාලිකා හදාගෙන ඉන්න හැටි දැක්කම දුක හිතෙනවා. ඇයි මේ දක්ෂයන් මෙහෙම වර්ග කරන්නෙ?

"අපෝ ලෝකල් පොරවල් සින්දු කියන්නෙ" කියලා අපහාසයට කියන අය මම ඕනේ තරම් දැකලා තියෙනවා. දක්ෂයෙක් නම් ලෝකල්ද ඉම්පෝටඩ් ද කියලා වර්ග කරගන්නෙ මොකටද? දක්ෂයා ලෝකල් වුණාම දක්ෂකම් බාලවෙනවද?

තමන් ළඟම ඉන්න දක්ෂයා අගය කරන්න. ඔහුගෙ දක්ෂකම් හදවතින්ම විඳින්න. ගායනා ක්ෂෙත්‍රයේ විතරක් නෙවෙයි. හැම කලා ක්ෂෙත්‍රයකම.

**පලි - හේමන්තයේදී ප්‍රසංගයේදී ඉදිරිපත් වුණ රංගන සහ උදුම්බරාගේ නර්තන නිර්මාණ හරිම ලස්සනයි**

## මේ කමිසය අපේ තාත්තගෙ



තමන් හැර ගිය ආදරණීය පියතුමා මෙයට වසර තිහකට පෙර ගයපු ගීයක් අද පුතෙක් එදා තාත්තා ඇඳගෙන හිටිය කමිසයම ඇඳගෙන ගයනා කරනවා දකින්න ලැබුණොත් ඔබට මොකක් හිතෙයිද? ඔබේ ඇසට කඳුලක් නොනැගී තිබෙයිද?

හේමන්තයේදී ප්‍රසංගයේදී හේමන්ත ඩයස් ඒ සංවේදී ක්‍රියාව කළා. තම ප්‍රසංගයෙදි තමන්ගේ ආදරණීය පියාණන් සිහි කරන්නට මෙයටත් වඩා යමක් කරන්නට පුතෙකුට හැකි වෙයිද?

කලාකාරයන් කියන්නෙ වෙන අයට නොදැනෙන වෙන අයට නොසිතෙන යමක් කරන මිනිසුන් පිරිසකටයි.

## අතින් කාලා හරක් බැලීම?



හේමන්තයේදී ප්‍රසංගයේ නිවේදන කටයුතු කළ අපේ හිතවතා - පැතුම් තිලකසිරි අපූරු කතාවක් කිව්වා.

හේමන්ත ඩයස් අතින් වියදම් කරගෙන ගිහින් අත්වැල් ගායනා කරපු ප්‍රසංග සංවිධානය කළ අය ගෙන් දෙන්නා ගානෙ ආවා නම් අද මේ ශාලාව පුරවන්න තිබුණා කියලා.

කතාව ඇත්ත. ඒක අපි හැමෝම අත්දකින දෙයක්. අපෙන් උදව් ලබා ගත් අයගෙන් කීයෙන් කී දෙනාද අපි වැඩක් කරනකොට ඇවිත් සහයෝගයක් දෙන්නෙ? මේ වගේ දෙවල් වලින් හිත කළ කිරෙනවා තමයි. ඒත් ඒ නිසා හිත් අධෛර්ය කරගත යුතු නැහැ.

අපට හිත හදා ගන්න හොඳ කතාවක් අපේ හිතවතෙක් නිතරම කියනවා මන්තරයක් වගේ. "දෙන දෙයක් පිරිසිදුව දෙන්න. ආයෙත් යමක් නොලැබුණාට කමක් නැහැ"

කතාවට එහෙම කිව්වට යුතුකම් කියල ජාතියකුත් මේ ලෝකෙ තියෙනවානෙ. ඒවා ඇහැට ඇඟිල්ලෙන් ඇනලා පෙන්නලා දෙන්න අවශ්‍ය නැහැනෙ.